සැ. යු. - (i) 2020.01.09 වැනි දින පළ වූ අංක 2158 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2020 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,159 - 2020 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2020.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 102 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 103 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 106 |


සැ. යු. -(i) *උඩරට විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II *වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*
(ii) *ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2020 ජනවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II *වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 පෙබරවාරි මස 07 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2020 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

---

# බඩු බාහිරාදිය විකිණීම්

## ශ්‍රී ලංකා පොලිසිය - කැළණිය කොට්ඨාසය

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

ශ්‍රී ලංකා පොලිසියේ කැළණිය පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවල සහ කාර්යාලවල පාවිච්චි කර ගර්භිත කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2020.01.28 දින පැය 10.00 ට පෑලියගොඩ පොලිස් ස්ථාන පරිශ්‍රයේ දී පැවැත්වේ.

2020.01.27 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා අදළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

වෙන්දේසි භූමියට ඇතුලුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා ලදුපත් ලබා ගත යුතු යි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ 2020.01.28 වැනි දින පැය 16.00 ට පෙර අදළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩල විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ඩබ්. කේ. ජේ. රොෂාන් ඩයස්,
පොලිස් අධිකාරි,
කැළණිය කොට්ඨාසය.

#### උපලේඛනය

කැළණිය කොට්ඨාසයේ වෙන්දේසි කිරීම සඳහා ඇති භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 1. | අයන් (ස්ත්‍රික්ක) | 02 |
| 2. | පැක්ස් යන්ත්‍ර | 05 |
| 3. | බාල්දි | 05 |
| 4. | මන්නා පිහි | 09 |
| 5. | මේස විදුලි පංකා | 06 |
| 6. | විදුලි කේතල | 01 |
| 7. | රේඩියෝ කැසට් යන්ත්‍ර | 06 |
| 8. | මල්ටි පොට් | 03 |
| 9. | වතුර පිල්ටර් | 02 |
| 10. | වතුර මෝටර් | 01 |
| 11. | විදුලි පන්දම් රතු | 01 |
| 12. | පාපැදි | 05 |
| 13. | ඇලුමිනියම් ජෝගු | 04 |
| 14. | වානේ සේප්පු | 01 |
| 15. | වාහන පරීක්ෂා කිරීමේ කණ්නාඩි | 02 |
| 16. | ආරක්ෂක වැට | 02 |
| 17. | පීඩන ලාම්පු | 01 |
| 18. | ලන්තෑරුම් | 02 |
| 19. | ගෑස් ලාම්පු | 01 |
| 20. | මේස ලිපිකරු අයන් | 01 |
| 21. | යතුරු ලියන සිංහල | 11 |
| 22. | යකඩ කූරු | 02 |
| 23. | සිවිලින් පෑන් | 20 |
| 24. | කාර්යාල ලොකු රෝද පුටු | 01 |
| 25. | සී. එල්. අයි. යුනිට් | 03 |
| 26. | රූපවාහිනී | 08 |
| 27. | ටයිප් රයිටර් ටූල්කිට් | 01 |
| 28. | යකඩ කැබිනට් | 01 |
| 29. | යකඩ කබඩ් | 17 |
| 30. | ග්ලයින්ඩර් | 01 |
| 31. | වෝටර් බොයිලේරු | 06 |
| 32. | හීටර් | 01 |
| 33. | පින්ටර් | 02 |
| 34. | අත් හිරමන | 02 |
| 35. | යකඩ කියත් | 01 |
| 36. | මල් ඉස්කුරුප්පු නියන් | 01 |
| 37. | උල් අඩු | 01 |
| 38. | පෙරව තල | 04 |
| 39. | විල් බැරෝ | 02 |
| 40. | කොන්ඩි පට්ටම් | 01 |
| 41. | ගිණි නිවීමේ උපකරණ | 05 |
| 42. | ස්පීකර් සෙට් | 01 |
| 43. | යතුරු ලියන ඉංග්‍රීසි | 02 |
| 44. | ගෑස් කුකර් | 03 |
| 45. | රයිස් කුකර් | 02 |
| 46. | සාස්පාන් 18" | 02 |
| 47. | සාස්පාන් 16" | 03 |
| 48. | සාස්පාන් 12" | 02 |
| 49. | ගෑස් සිලින්ඩර් ලොකු | 01 |
| 50. | ඇලුමිනියම් කේතල | 01 |
| 51. | ලයිට් සිකුරුටි | 01 |
| 52. | රයිස් බොයිලේරු | 02 |
| 53. | තණකොළ කපන මැෂින් | 01 |
| 54. | යූ. පී. එස්. | 04 |
| 55. | පරිගණක යන්ත්‍ර | 01 |
| 56. | රේක්ක | 01 |
| 57. | ප්ලේන් ජෝගු | 03 |
| 58. | පිඟන් එනමල් | 01 |
| 59. | විදුලි පන්කම් එවරෙඩි | 03 |
| 60. | විදුලි පන්දම් ටයිගර් හෙඩ් | 04 |
| 61. | පාපැදි පැඩල් ජෝඩු | 04 |
| 62. | පාපැදි ස්පෝක් | 311 |
| 63. | පාපැදි ඇක්ෂල් කෝන් | 25 |
| 64. | පාපැදිචේන් | 02 |
| 65. | පාපැදි හබ් පිටුපස | 05 |
| 66. | පාපැදි ලගේජ් | 01 |
| 67. | පාපැදි කටර්පින් | 06 |
| 68. | ඉබි යතුරු 2 1/2 | 02 |
| 69. | ශීතකරණ | 01 |
| 70. | වානේ අල්මාරි | 02 |
| 71. | පයිල් කබඩ් | 02 |
| 72. | වානේ රාක්ක | 01 |
| 73. | පරිගණක පුටු | 03 |
| 74. | පුටු යකඩ | 02 |
| 75. | අමුත්තන් සඳහා පුටු | 02 |
| 76. | ගාඩන් ස්නයිසර් | 02 |
| 77. | යකඩ තාච්චි | 02 |
| 78. | ඇළුමිනියම් තාච්චි | 01 |
| 79. | මේස හැඳි | 04 |
| 80. | මොන්ටර් | 01 |
| 81. | පාපැදි ෆ්‍රීවිල් | 01 |

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන ජේදයට අනුව පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බෙස්ට් බිසිනෙස් ලංකා (පීවීටී) එල්ඩීඩී
ලියාපදිංචි අංකය : පීවී 00215011
සංස්ථාගත කළ දිනය : 2019.08.30
ලියාපදිංචි ලිපිනය : අංක 33/50, සින්න තෝනා වීදිය, කාත්තාන්කුඩි 02.

එස්. එච්. එම්. රිස්වි,
සමාගම් ලේකම්.

01-404

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණිය පාර අංක 156/6 හි පදිංචි පුෂ්පා චාන්දනි තිලකරත්න (ජාතික හැඳුනුම්පත් අංක 555421494 V හිමි) වන මම මහනුවර පේරාදෙණිය පාර අංක 156/6 ලිපිනයේ පදිංචි රධිකා ශිරන්ති තිලකරත්න (ජාතික හැඳුනුම්පත් අංක 567620921 V හිමි) යන අය වෙත ඇටෝර්නි බලය පවරමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සංජය පී. විජේතුංග මහතා විසින් 2008 ක් වූ ජුනි මස 09 වැනි දින ලියා සහතික කළ අංක 668 දරන ඇටෝර්නි බලපත්‍රය එහි ඇටෝනි අධිපති වන මා විසින් වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින වලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී රධිකා ශිරන්ති තිලකරත්න (ජා. හැ. අංක 567620921 V හිමි) යන අය විසින් එම ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හා එය උපයෝගි කරගෙන කරන කිසිම ක්‍රියාවකට වග නොකියන බවට මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. මෙම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලය, මහනුවර හි ලිඛිතව බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ දින පොත් අංක 1292 යටතේ 03 වන කාණ්ඩයේ 34 වන පත්‍ඉරුවේ ලියාපදිංචි කරන ලදී.

පුෂ්පා චාන්දනි තිලකරත්න,
ඇටෝර්නි අධිපති.

01-405/1

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණිය පාර අංක 156/6 හි පදිංචි පුෂ්පා චාන්දනී තිලකරත්න (ජාතික හැඳුනුම්පත් අංක 555421494 V හිමි) වන මම මහනුවර ගම්පල හිල් ස්ට්‍රීට් අංක 21 ලිපිනයෙහි පදිංචි ප්‍රභාත් පරාක්‍රම රණවීර (ජා. හැ. ප. අංක 611830017 V) යන අය වෙත ඇටෝර්නි බලය පවරමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සංජය පී. විජේතුංග මහතා විසින් 2003 ක් වූ දෙසැම්බර් මස 13 වැනි දින ලියා සහතික කළ අංක 142 දරන ඇටෝර්නි බලපත්‍රය එහි ඇටෝනි අධිපති වන මා විසින් වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින අවලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී ප්‍රභාත් පරාක්‍රම රණවීර (ජා. හැ. අංක හිමි 611830017 V හිමි) යන අය විසින් එම ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හා එය උපයෝගි කරගෙන කරන කිසිම ක්‍රියාවකට වග නොකියන බවට මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. මෙම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලය, මහනුවර හි ලිඛිතව බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ දින පොත් අංක 1473 යටතේ 19 වන කාණ්ඩයේ 14 වන පත්‍ඉරුවේ ලියාපදිංචි කරන ලදී.

පුෂ්පා චාන්දනි තිලකරත්න,
ඇටෝර්නි අධිපති.

01-405/2

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ නාමය වෙනස් වීම පිළිබඳ දැන්වීමයි.

පෙර පැවති නාමය : මධු නදී ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 74960
ලියාපදිංචි ලිපිනය : අංක 231/32, පීටර් මාවත, අමන්දොළුව, සීදුව.
නව නාමය : නිව් මධු නදී ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
නාමය වෙනස් කළ දිනය : 2018 ජූලි මස 13 වැනි දින.

සමාගමේ ලේකම්වරු.

01-440

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුගේගොඩ හයිලෙවල් පාර, අංක 202 හි පදිංචි ෆාතිමා ෆර්හා ෆයිසාල් විවාහයට පෙර කොහොම්බන් ආරච්චිගේ තනූජා ලක්ෂිත් (ජාතික හැඳුනුම්පත් අංක 737170039 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සහ එහි පොදු ජනතාව වෙත මෙයින් දන්වා සිටින වගනම් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කීර්තී උඩවත්ත විසින් සහතික කරන ලද වර්ෂ 2003 ජනවාරි 22 වැනි දින අංක 298 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් තෙන්නකෝන් මුදියන්සේලාගේ පත්මලතා (ජාතික හැඳුනුම්පත් අංක 717383630) ඇටෝර්නි බලකරු සේ කරන ලද පත්කිරීම මෙයින් අවලංගු කරන බවත් මින් ඉදිරියට ඇය විසින් සිදු කරන කිසිදු ගනුදෙනුවක් සඳහා මාගේ වගකීමක් නොමැති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ෆාතිමා ෆර්හා ෆයිසාල්.

01-452

---

## දැන්වීම

ඩුනාමිස් කැපිටල් පී. එල්. සී. සමාගම

ජනශක්ති පී. එල්. සී. සමාගම සමඟ ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තියට ප්‍රකාරව දන්වා සිටින්නේ, ඩුනාමිස් කැපිටල් පී. එල්. සී. සමාගම සහ ජනශක්ති පී. එල්. සී. සමාගම, සමාගම් පනතේ 239 වන වගන්තියට ප්‍රකාරව ඒකාබද්ධ කර ඇති බවත්, එම ඒකාබද්ධ සමාගම ජනශක්ති පී. එල්. සී. වන බවත් ය.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මෙම ඒකාබද්ධ කිරීම අනුමත කර ඇති අතර, එම ඒකාබද්ධ කිරීමේ බලාත්මක දිනය වන්නේ 2019 දෙසැම්බර් 06 වන දිනයයි.

ඒකාබද්ධ කිරීමේ සහතිකය සහ සංස්ථාගත කිරීම සහතිකය, ජනශක්ති පී. එල්. සී. හි ලියාපදිංචි කාර්යාලය වන අංක 02, ඩීල් පෙදෙස, කොළඹ 03, යන ස්ථානයේ දී පරීක්ෂා කළ හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගයෙන්,

කේ. එච්. එල්. කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ජනශක්ති පී. එල්. සී.

01-456

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : චන්ගමී කොරියන් සප්ලයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 105754
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 251/10, කිරුල පාර, කොළඹ 05.
ලියාපදිංචි දිනය : 2015.05.21

සමාගමේ නම : ඉන්ට්‍රින්සික් ලීඩර්ෂිප් ඇකඩමි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 127389
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 97, ගාලු පාර, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2017.11.20

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-469

---

## දැන්වීමයි

වර්ෂ 2019.11.22 වැනි දින පළ කරන ලද අංක 2151 දරන ගැසට් පත්‍රයේ 11-1592 දරන නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය : -

සංශෝධනයයි

අංක 57/ඩී, හියාරේ හන්දිය, ගොනාමුල්ල හි පදිංචි ජයසුන්දර ආරච්චිගේ විසුද්ධ නාමල් වන මා 2016.06.12 වැනි දින අත්සන් තබන ලද අංක 1407 දරන ඇටෝර්නි බලපත්‍රය ගාල්ල දකුණු කලාප කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටර්නි බලපත්‍ර 69 කාණ්ඩයේ 46 පත්‍රිරුවේ 1472 දිනපොතේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස වලහන්දුව, මානවිල, ගමගෙ වත්ත ''තිළිණි'' හි පදිංචි හබරාදුව හේවගේ තිළිණි මධුෂානි සමරසිංහ යන අයගේ පත් කිරීම වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින සිට නිත්‍යානුකූලව අවලංගු කරන බව මින් සියලු දෙනාගේ දැන ගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

ජයසුන්දර ආරච්චිගේ විසුද්ධ නාමල්.

01-480

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හයිරියා ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : 84/4 එච්, පල්ලේවැලිකැටිය, බුලුගොහොතැන්න, අකුරණ
සංස්ථාගත කළ දිනය : 2017 නොවැම්බර් 27
ලියාපදිංචි අංකය : පී වී 127614.

අධ්‍යක්ෂකවරු.

01-489

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සාරුක් ජෙම් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි කාර්යාලය : 125/1 ඩී, පල්ලේවැලිකැටිය, බුලුගොහොතැන්න, අකුරණ
සංස්ථාගත කළ දිනය : 2019 නොවැම්බර් 05
ලියාපදිංචි අංකය : පීවී 00217254

අධ්‍යක්ෂකවරු.

01-490

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් පෞද්ගලික සීමිත වගකීම් සහිත සමාගම 2020 දෙසැම්බර් මස 19 වැනි දින සංස්ථාගත කරන ලද බව මින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එස්. කේ. ෆාර්ම් ඇන්ඩ් ඇග්‍රිකල්චර් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 00218532
ලියාපදිංචි කාර්යාලය : අංක 14, දෙවන හරස් වීදිය, උදයනගර්, කිළිනොච්චිය.

සමාගම් ලේකම්.

01-615

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නම පහත පරිදි වෙනස් කර ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : ත්‍රී ඩී හෝම්ස් (පී වී ටී) එල්ටීඩී
වෙනස් කළ පසු නාමය : විලාස් කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00217505
ලියාපදිංචි කාර්යාලය : අංක 115/6 ඒ, පොකුණ පාර, මාලාමුල්ල, පානදුර
ලියාපදිංචි දිනය : 2019.12.27

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-506

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2018.10.15 වැනි දිනැති ලිවර්පූල්, එක්සත් රාජධානියේ සොලිසිටර් ඩේවිඩ් ස්පීඩ් මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය කොළඹ 06, වැල්ලවත්ත, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පාර, අංක 69 හි පදිංචි සන්නාසි මුත්තයියා ෂන්මුගරාජා යන අයට C/O T2M SW London Ltd, No. 28, London Road Tooting London SW 17 9HW, United Kingdom හි පදිංචි අල්රින් ගෝබිනාත් ෂන්මුගරාජා වන මා විසින් ලබාදුන් එකී ඇටෝර්නි බලපත්‍රය 2019.10.28 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

අල්රින් ගෝබිනාත් ෂන්මුගරාජා.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින.

01-492

## කැන්ඩර් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්

### සමාගම් ලියාපදිංචි අංකය පීවී 75998

### සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම

2019 නොවැම්බර් මස 14 වැනි දින සමාගමේ සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (b) වගන්තිය යටතේ මෙම සමාගම 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

එස්. වී. ද සොයිසා,
ආර්. එන්. දේවිදි,
ඩී. ආර්. අබේසූරිය,
අධ්‍යක්ෂකවරු.

2019 නොවැම්බර් මස 26 වැනි දින.

01-617

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : විකසිත ගාර්ඩන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00209219
ලියාපදිංචි කළ දිනය : 2019.02.25
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 15/1/1, බැන්ඩියාවත්ත පාර, වැල්ලම්පිටිය, කොලොන්නාව - 10600

සමාගම් ලේකම්.

01-669

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

පුත්තලම දිසා අධිකරණයේ දී ය

පුත්තලම කුරුණෑගල පාරේ, අංක 116 A දරන ස්ථානයේ ''පුත්තලම ශාඛාව'' යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයේ සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

නඩු අංකය : 74/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 394,677.27
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

.............................පැමිණිලිකරු

එදිරිව

පුත්තලම, 3 වන හරස් වීදිය, 3 වන පටුමග, අංක 32/1 දරන ස්ථානයේ

අබ්දුල් වහීඩ් අබ්දුල් රාවුෆ්ඛාන්.

...............................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2018 ක් වූ මාර්තු මස 12 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට විත්තිකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 303,200 ක මුදලක් සහ රු. 91,477.27 ක මුදලක් යනුවෙන් එකතුව රු. 394,677.27 ක් වන්නාවූ මුදලක් සහ එකී රු. 303,200 ක මුදල මත 2014 නොවැම්බර් මස 06 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 19% බැගින් වැඩිදුරටත් පොළියක් ද ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ සහ මෙහි වූ උපලේඛනයෙහි විස්තර ඇති ඉඩම සහ ස්ථානය බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට ද නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2018 ක් වූ මාර්තු මස 12 වැනි දින පුත්තලම දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ, එම දේපළ පිහිටි ස්ථානයේදී වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 07 වැනි දින ප. ව. 1.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම කඩවත් කොට්ඨාසය ඇතුළත පුත්තලම කඩවත් හි පුත්තලම නගර සභා සීමාව ඇතුළත දකුණු නාගමඩුව හි පිහිටා ඇති ''ඔඩයාවේලිකානි'' යනුවෙන් හැඳින්වෙන බෙද වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම වේ. මෙය පුත්තලමේ බලයලත් මිනින්දෝරු ආර්. කේ. කනගරත්නම් විසින් සාදන ලද අංක 7014 සහ 1997.08.12 වැනි දින දරන සැලැස්මේ අංක 78 දරන බිම් කැබැල්ල ලෙස නිරූපිත අතර ප්‍රමාණයෙන් පර්චස් නවයකින් (අ. 0 රූ. 0 පර්. 9) යුක්තය. එසේ නැතහොත් උතුර සිට දකුණට අඩි (30') තිහයි. නැගෙනහිරට සිට බස්නාහිරට අඩි (75') හැත්තෑපහයි සහ එකී ඉඩමට මායිම් උතුරට : කන්දයියාගේ සහ අනිකුත් අයගේ ඉඩම, නැගෙනහිරට : අංක 7014 දරන සැලැස්මේ අංක 114 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති අඩි (15') පහළොවක ප්‍රවේශ මාර්ගය, දකුණට : අංක 7014 දරන එම සැලැස්මේ අංක 77 බිම් කැබැල්ල සහ බස්නාහිරට: අංක 7014 දරන සැලැස්මේ අංක 55 බිම් කැබැල්ල වේ. සමස්ථයම මෙකී සීමාවන් ඇතුළත පිහිටියේ ය. එෆ්. 99/239 හි ලියාපදිංචි කර ඇත.

මෑතක දී කරන ලද මැනීමක් අනුව, එකී ඉඩම පුත්තලමේ බලයලත් මිනින්දෝරු වී. ටී. බාලසුබ්‍රමානියම් විසින් සාදන ලද අංක 3936 සහ 2009.05.07 වැනි දින දරන සැලැස්මේ අංක 01 බිම් කැබැල්ල ලෙස නිරූපිතව ඇත. එම බිම් කැබැල්ලට මායිම් උතුරට : කේ. කන්දයියාගේ සහ අනිකුත් අයගේ ඉඩම, නැගෙනහිරට: අංක 7014 දරන සැලැස්මේ අංක 114 බිම් කැබැල්ල වන අඩි (15') පහළොවක පළල අඩිපාර, දකුණට : අංක 7014 දරන සැලැස්මේ අංක 77 බිම් කැබැල්ල, බස්නාහිරට : අංක 7014 දරන සැලැස්මේ අංක 55 බිම් කැබැල්ල සහ ප්‍රමාණය පර්චස් නවයක් (අ. 0 රූ. 0 පර්. 9) වේ. සමස්ථයම මෙම සීමාවන් ඇතුළත පිහිටා ඇත.

*ඉඩමට පිවිසීම.* - පුත්තලම නගරයේ සිට තම්බපන්නි පටුමග (කුවේට් හොස්පිටල් පාර) හංදිය දක්වා කිලෝමීටර් 2.2ක් පමණ දුරක් මන්නාරම පාර ඔස්සේ ගමන් කර ඉහත සඳහන් කළ පාරට දකුණට හැරී මීටර් 700ක් පමණ ගමන් කර වෙන් කරන ලද කොටස්වලට මග පෙන්වන පාර වෙන්කිරීමට වමට හැරී තවදුරටත් මීටර් 100ක් පමණ දුරක් ගමන් කළ විට මාර්ග අවසානයට ඇති දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (2) නොතාරිස් ගාස්තු ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව, (3) සියලුම ප්‍රචාරක වියදම්, (4) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු සියයට දෙකයි දශම පහයි (2.5%), (5) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු (6) ලිපිකරු සහ සෝෂක ගාස්තුව රු. 6,000, (7) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) මුදල දින 30ක් ඇතුළත දී පුත්තලම දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සමරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහල,
මරදාන පාර,
කොළඹ 10.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු.
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්
වාණිජ මහාධිකරණය සහ කොළඹ දිසා
අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ
බලයලත් වෙන්දේසිකරු.

රාජ්‍ය හා වාණිජ බැංකු අංක 200,
2 වන මහල, හල්ෆ්ඩ්‍රොප් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 011- 2445393/011- 2396520.
ඊමේල් : senaservice84@gmail.com

දුරකතන අංක : 011-2672262
011-2672263
ෆැක්ස් 011-2683073.

01-478

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මීගමුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද 2015.02.16 දින සහතික කළ අංක 4883 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රොනි කොටේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ මීගමුව මහ නගර සභා සීමාව තුළ 75 ඒ - පලගතුරය ග්‍රාම නිලධාරි වසම තුළ පලගතුරේ ගමේ පිහිටි කුඹුක්වත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බාලේන්දිරන් විසින් සාදන ලද අංක 2014.01.209 හා 2014.09.13 දින දරන පිඹුරේ ලොට් ''ඒ'' වශයෙන් දක්වෙන ඉඩම් කොටස,

ප්‍රමාණය : රූඩ් එකයි පර්චස් දොළහයි දශම අටයි පහක් (අ. 0, රූ. 1, පර්. 12.85) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.07.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2019.08.13 වැනි දින මව්බිම, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - දළුවකොටුව හංදියේ සිට හලාවත - කොළඹ ප්‍රධාන පාර ඔස්සේ මීටර් 140ක් පමණ මීගමුව දෙසට ගමන් කර ශාන්ත ආනා පාරට දකුණට හැරී කිලෝමීටර් 1.1ක් පමණ ගමන් කර පලගතුරේ පල්ලිය ඉදිරිපිටින් වමට හැරී මීටර් 100ක් පමණ ගමන් කර වමට ඇති අදාළ දේපළ වෙතට ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම් මිලේ ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුයි. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12,
දුරකතන/ෆැක්ස් 011- 2445393,
ඊමේල් : senaservice84@gmail.com

ජ්‍යෙෂ්ඨ කළමණාකරු - ණය අයකිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකතන අංක : 011-2661828/011-2661866.

01-505

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කළුතර ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බී ෆැෂන් ගාමන්ට්ස් යන නාමය අභිධානය හා ව්‍යවහාරික ව්‍යපාරික නාමය යටතේ තනි හිමිකාරිත්වයක් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන වෙල්අරුමගේ කසුන් බද්ධික ප්‍රනාන්දු විසින් ණයකරු වශයෙන් පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 5071 හා 2015 දෙසැම්බර් මස 10 වැනි දින දරන බැදුම්කර හා හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් වෙල්අරුමගේ කසුන් බුද්ධික ප්‍රනාන්දු වෙත ප්‍රදනය කරන ලද නිවාස ණය පහසුකම් ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 5386 හා 2016 සැප්තැම්බර් මස 30 දින දරන සහ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. පී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 2263 හා 2018 මැයි 10 දින දරන උකස් බැදුම්කර යටතේ මගින් මෙහි උපලේඛනයේ වඩාත් සම්පූර්ණයෙන් විස්තර කර ඇති දේපළ ණයකරු වෙල්අරුමගේ කසුන් බුද්ධික ප්‍රනාන්දු ලෙස පැහැර හැර ඇති හෙයින් බැදුම්කරය යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ,

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2020 පෙබරවාරි 6 වැනි දින පෙ. ව. 11.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ උතුර, කළුතර ප්‍රාදේශීය කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව ඇතුත 729 ඒ අලුබෝගහලන්ද ග්‍රාම නිලධාරී වසම තුළ නාගොඩ පිහිටි අලුබෝගහවත්ත පින්නකොලලන්ද සහ අලුබෝගහවත්ත කොටසක් හෙවත් පින්නකොලලන්ද නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එම්. වී. ටී. පී. ජයසුන්දර විසින් සාදන ලද අංක 11/07 හා 2011 ජනවාරි මස 18 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් ඒ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම දෙකයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 23.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2019.06.28 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2019.07.11 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කළුතර කටුකුරුන්ද හන්දියේ සිට මතුගම පාර දිගේ කි. මී. 1.25 පමණ දුරක් ගොස් වම් පැත්තට හීනටියගල පාරට හැරෙන්න. තවදුරටත් මීටර් 350ක් පමණ හීනටියගල පාර දිගේ ගොස් සෙන්ටර් හන්දියෙන් දකුණු දෙසට ශ්‍රී සන්දර්ශනාරාම පාරට (අඩි 12 පළල පාර) හැරී මීටර් 150 පමණ එම පාර දිගේ ගමන කරන්න. "Y" හන්දියත් සහ ක්‍රීඩාපිට්ටනිය හමුවේ. මිනින්දෝරු සැලැස්මේ සඳහන් ඇති "Y" හන්දියට මුහුණ දී අදල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක : 011 2661866, 011- 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනට ම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක : 011- 2053286/072-3207533
076-9217329/072-0881044.

01-511